නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මිණිපේ
வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மினிப்பே
Resident Project Management Office – Minipe

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

මොරයාය
මිණිපේ
மொரயாய
மினிப்பே
Morayaya
Minipe

මගේ අංකය / எனது இல. / My Ref No

ඔබේ අංකය / உமது இல. / Your Ref No

දිනය / திகதி / Date 2018 /05/ 04

# 2018 මැයි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්ථාව

ස්ථානය - උඩවෙල සංස්කෘතික මධ්‍යස්ථානය
දිනය - 2018/ 05 / 04.
වේලාව - පෙ.ව. 10.00

ආගම සිහි කිරීම සහ ව්‍යාපාරයේ නිර්මාතෘන් හා මියගිය ගොවි නායකයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවකින් අනතුරුව මෙදින පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම විශේෂ ව්‍යාපාර කමිටු රැස්වීමක් බවත් ව්‍යාපාර කමිටුව සදහා සහභාගී විය හැක්කේ ගොවි සංවිධාන සභාපතිතුමා හෝ සභාපතිතුමාගේ ලිඛිත අවසරය සහිතව ලේකම්වරයාට පමණක් බව දන්වා සිටිමින් ව්‍යා.කළ.කමිටු රැස්වීමේ අරමුණු පැහැදිලි කරන ලදී. ඒ අනුව ,

## අරමුණු

* 2018 යල් කන්න පිළිබද ගැටළු රාශියක් පැන නැගී ඇති බැවින් 2018 යල කන්න - කන්න තීරණ පිළිබද සංශෝධනයක් සිදුවිය යුතුනම් ඒ පිළිබද සාකච්ඡා කිරීම.
* වැව් 05 පැන නැගී ඇති ගැටළු පිළිබද සාකච්ඡා කිරීම.
* මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය පිළිබද සාකච්ඡා කිරීම හා ඒ හා සමගාමීව බැදුණු වන වගා ව්‍යාපෘතිය පිළිබදව දැනුවත් කිරීම.

## ලිපි ඉදිරිපත් කිරීම

1. 2018 යල කන්නයේ වාරි ජලය ලබා දීම සහ ඇළ මාර්ග සංවර්ධන කටයුතු 2018 යල කන්න තීරණ වලට අනුව සිදු කරන ලෙස දන්වා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් වෙත මාතලේ දිස්ත්‍රික් ලේකම්තුමා විසින් යොමු කළ ලිපියේ පිටපත.

2. කන්න 05 ක පමණ වගා කටයුතු නොමැතිකමින් අසරණව සිටි ගොවි මහතුන් වෙනුවෙන් ආධාර ලබා දීම සම්බන්ධව ස්තූතිය පුද කර මහවිලච්චිය ව්‍යාපාරයේ ඒකාබද්ධ ගො. සං. සභාපති විසින් එවන ලද ලිපිය.

3. 26/27, මොරයාය, මිණිපේ ලිපිනයෙහි පදිංචි K.G. සෙනවිරත්න මහතා විසින් 26/27 මඩ ඉඩමට D26 කෙත් ඇලෙන් ජලය ලබා ගැනීම සදහා අවශ්‍ය කුඹුරු බට ලබා දෙන ලෙස වාරිමාර්ග කාර්යාලයට යොමු කරන ලද ලිපිය.
4. පුනරුත්තාපන කටයුතු වලට හානි නොවන අයුරින් 2018 යල කන්න වගා කටයුතු සිදු කිරීමට D25 ඇලට ජලය ලබා දෙන ලෙස 1 පියවර D25 බෙ.ඇ. ගො.සං. සභාපති විසින් ඉල්ලීම් කරන ලද ලිපිය.

5. 2 පියවර D1 සංවර්ධන කටයුතු අගෝ. - සැප්. මාස වනවිට සිදු කළ හැකි බැවින් ඉන් අනතුරුව D1 ඇලට ජලය ලබා දෙන ලෙස 2 පියවර D1 ගො.සං. සභාපති විසින් යොමු කළ ලිපිය.

6. D43 දිඹුලමුල්ල ගොවි මහතුන්ගේ ගැටළු විසදා ගැනීම සදහා 2018.05.10 වන දින සාකාච්ඡාවක් අවශ්‍ය බවට කළ ඉල්ලීම් ලිපිය.
7. 1 පියවර D13 බෙ.ඇ. ගො.සං අයත් D15 බෙදුම් ඇලේ දීර්ඝ කාලීනව පවතින ජල ප්‍රශ්නයට විසදුම් ලබා දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යොමු කරන ලද ලිපිය.
8. මිණිපේ 2 පියවර D 25 - RB 02 ඇලෙන් පහළ කොටසට ජලය ලබා දෙන ලෙස වාරිමාර්ග ඉංජිනේරුතුමා වෙත ඉල්ලීම් කළ ලිපිය.

| ඉදිරිපත් කිරීම | ගැටළුව | විසදුම් ලබා දුන් ආයතනය |
|---|---|---|
| 1 පියවර D47 ගො.සං. සභාපති | CRIP ව්‍යාපෘතිය යටතේ සංවර්ධන වන D47 බෙදුම් ඇලේ විශේෂ ගැටළු සහිත සංවර්ධනය විය යුතු ස්ථාන පිළිබද ගො.සං. විසින් දැනුවත් කර තිබූ නමුත් එම ගැටළු ඇති ස්ථාන සංවර්ධනය නොවීම.<br><br>දැනට ඇස්තමේන්තු කර ඇති සංවර්ධන කටයුතු වෙනස් කර අදාළ ගැටළුව ඇති ස්ථාන වල එම සංවර්ධන කටුයුතු සිදු කර දෙන ලෙස වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ඉල්ලා සිටින ලදී. | CRIP ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබද ප්‍රමුඛතා ලේඛන ඇස්තමේන්තුව ව්‍යාපෘති අධ්‍යක්ෂක කාර්යාලය මගින් සකස් කළ ලේඛනයක් බවත් ,<br><br>CRIP ව්‍යාපෘතිය මගින් සංවර්ධනය වන සෑම සංවර්ධන කටයුත්තක්ම නොව වෙනස් කිරීමේ හැකියාව ඇති සංවර්ධන කටයුතු පමණක් ස්ථානමාරු කර සංවර්ධනය කළ හැකි බවත් ,<br><br>එසේම ඉදිරි දින කිහිපය ඇතුළත එම කොන්ත්‍රාත් සමාගම් හා එක්ව ගොවීන් දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වන්නට කටයුතු කරන බවත් පවසන ලදී. |
| 2 පියවර D24 ගො.සං. සභාපති | D25 බෙදුම් ඇල තුළ ගැටළු පවතින ස්ථාන වල CRIP ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු සිදු නොවන බවත් ගැටළු අවම ස්ථාන වල එම සංවර්ධන කටයුතු සිදු වන බවත් අගාවත දක්වා ජලය ගෙන යාමට නම් එම ගැටළු පවතින ස්ථාන වලට පිළියම් යෙදිය යුතු බවත් ,<br><br>මේ වන විට CRIP ව්‍යාපෘතිය සංවර්ධන කටයුතු සදහා අවස්ථාව ලබා දී මාස 1 ½ ක් පමණ කාලයක් ගත වී ඇති නමුත් තවමත් එම සංවර්ධන කටයුතු ආරම්භ කර නොමැති වීම ගැටළුකාරී තත්ත්වයක් බැවින් ඉදිරි දින කිහිපයක් තුළ එම සංවර්ධන කටයුතු ආරම්භ කරන ලෙසත් එසේ නොවුණහොත් ඉදියේදී විශාල ගැටළුකාරී තත්ත්වයන්ට මුණ දීමට සිදු වන බවත් පවසන ලදී. | |
| 1 පියවර D25 | පුනරුත්තාපන කටයුතු වලට හානි | |

| | | |
|---|---|---|
| ගො.සං. සභාපති | නොවන අයුරින් 2018 යල කන්න වගා කටයුතු සිදු කිරීමට D25 ඇලට ජලය ලබා දෙන ලෙස 1 පියවර D25 බෙ.ඇ. ගො.සං. සභාපති විසින් ඉල්ලීම් කරන ලද ලිපිය. | CRIP ව්‍යාපෘතිය හරහා සංවර්ධනය වන බෙදුම් ඇලවල් වල 2018 යල කන්න වගා කටයුතු සිදු නොකරන බව කන්න තීරණ වූ බවත් කන්න තීරණ වලට පටහැනිව කටයුතු නොකරන බවත් ගොවීන්ගේ ඉල්ලීම පරිදි ව්‍යාපාර කමිටු තීරණ වලට අනුව දිස්. ලේකම්තුමාගේ අනුමැතිය ලැබුණහොත් පමණක් ඒ අනුව කටයුතු කළ හැකි බවත් වාරිමාර්ග ඉංජිනේරුතුමා ප්‍රකාශ කරන ලදී. කුණු ඇලකට ජලය නිදහස් කිරීමට නොහැකි බව ද දන්වන ලදී. |
| 2 පියවර D1 ගො.සං. සභාපති | පියවර D1 සංවර්ධන කටයුතු අගෝ. - සැප්. මාස වනවිට සිදු කළ හැකි බැවින් ඉන් අනතුරුව D1 ඇලට ජලය ලබා දෙන ලෙස 2 පියවර D1 ගො.සං. සභාපති විසින් යොමු කළ ලිපිය. | |
| 1 පියවර D41 ගො.සං. සභාපති | CRIP සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු සිදු වන බෙදුම් ඇලවල් වල කන්න තීරණ අනුව වගා කටයුතු සිදු නොවන නමුත් වගල් සහිත කුඹුරු වල යම් වගාවක් සිදු කළ හොත් ඒ සදහා පොහොර සහනාධාරය ලබා දෙනවාද ? යන්න පිළිබද විමසා සිටින ලදී. | රජයේ තීරණ පරිදි මෙම කන්නයේ සිට පොහොර මිටියක් රු. 500 ක මිලට ලබා දීමට කටයුතු කර ඇති බවත් එම ලේඛන මේ වන විට සකස් කෙරෙමින් පවතින බවත්,<br><br>කන්න තීරණ වලට අනුව සංවර්ධනය වන බෙදුම් ඇලවල්වල යම් හෙයකින් වගල් කුඹුරු වල සහ වෙනත් ජල මූලාශ්‍ර පදනම් කරගෙන වගා කරන කුඹුරු සදහා පොහොර සහනාධාරය ලබා දීමට මහනුවර සහ මාතලේ දිස්ත්‍රික් පොහොර කමිටුවේදී තීරණය කළ බවත් ඒ සදහා ඒ ඒ ගො.සං. වලින් ලේඛන සකසා විශේෂ ව්‍යාපාර කමිටුවේ නිර්දේශ පරිදි ඉදිරිපත් කරන ලෙස ද දන්වන ලදී. |

<u>2018 යල කන්න තීරණ අනුව සංවර්ධනය වන බෙදුම් ඇල පද්ධතියේ වගල් සහිත සහ වෙනත් ජල මූලාශ්‍ර වලින් වගා කරන කුඹුරු ඉඩම් වල වාරි ජලය නොමැතිව සිදු කරනු ලබන වගාවන් සදහා පොහොර සහනාධාරය ලබා දීම සුදුසු බවට 1 පියවර D 41 ගො.සං. සභාපති විසින් යෝජනා කළ අතර 4 පියවර ප්‍රා.ගො.සං. සභාපති විසින් ස්ථිර කරන ලදී.</u>

| | |
|---|---|
| 4 පියවර ප්‍රා.ගො. සං. සභාපති | 2018 යල කන්න අතහැර CRIP ව්‍යාපෘතිය සදහා අවස්ථාව ලබා දුන්නද මේ වන විටත් එම සංවර්ධන කටයුතු ආරම්භ කර නොමැති වීම හේතුවෙන් ගැටළු රාශියක් උද්ගතව ඇති බවත් ඉදිරි දින කිහිපය තුළ එම සංවර්ධන කටයුතු සිදු නොකළහොත් 4 පියවර සමස්ථ ගොවි ජනතාව 2018 යල කන්නය සදහා ජලය ඉල්ලා උද්ඝෝෂණ පවා දියත් කිරීමට සූදානමින් සිටින බව ප්‍රකාශ කරමින් කියා සිටියේ කන්නක් අතහැර සංවර්ධන කටයුතු සදහා අවස්ථාව ලබා දුන්නේ ගොවි ජනතාවට ගැටළු රාශියක් |

| | |
|---|---|
| | පවතින බැවිනුත් එම ගැටළු මෙම සංවර්ධන කටයුතු හරහා විසදා ගැනීමට අවශ්‍යව ඇති නිසාත් බැව් ප්‍රකාශ කරන ලදී. එබැවින් එම සංවර්ධන කටයුතු ඉතා කඩිනමින් ආරම්භ කළ යුතු බව වැඩි දුරටත් දන්වා සිටින ලදී. |
| 3 පියවර D..<br>ගො.සං. සභාපති | මේ වන විට ජලය ඉල්ලා විරෝධතා ව්‍යාපාර ආරම්භ කිරීමට යම් යම් පිරිස් සූදානමින් සිටින බවත් එසේම සංවර්ධන කටයුතු සදහා අවස්ථාව ලබා දී මාස 1 ½ ක් පමණ කාලයක් ගත වුවද තවමත් එම සංවර්ධන කටයුතු ආරම්භ කර නොමැති වීම ඊට ප්‍රධාන හේතු ලෙසත් පවසමින් ඉදිරි දින කිහිපය ඇතුළත සංවර්ධන කටයුතු කඩිනම් කරන ලෙසත් එසේ නොවුණහොත් ඉදිරියේදී ගො.සං. නායකයින්ට හා සියළුම රාජ්‍ය නිලධාරීන්ට ගැටළු රාශියකට මුහුණ දීමට සිදු වන බව ප්‍රකාශ කරමින් කියා සිටියේ සංවර්ධන කටයුතු සිදු වන ඇලවල් වල ගොවි ජනතාවට යම් ආකාරයක සහනාධාරයක් හෝ ලබා දීමට කටයුතු කරන්නේනම් එය ඉතා වටිනා ක්‍රියාවක් වන බවත්ය. |
| වැව් 05 -<br>මල්ගම්මන<br>සභාපති | මේ වන විට යම් යම් පිරිස් ජලය ඉල්ලා උද්ඝෝෂණ දියත් කිරීමට සැරසී සිටින බවත් , නමුත් ජලය ලබා දුන්නද යල කන්න වගා කටයුතු සිදු කිරීමේ කාලය සීමා සහිත වන බැවින් වගා කටයුතු අසාර්ථක විය හැකි බවත් එබැවින් සංවර්ධන කටයුතු ඉතා කඩිනමින් ආරම්භ කර එම සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. |
| රදුන්නවැව ලේකම් | 3 සහ 4 පියවර සදහා ජලය ගෙන යාමේදී ඉතා දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදු වන බවත් විශේෂයෙන්ම දේවගිරිය ප්‍රධාන ඇල ගල්පොත්ත විශාල ගැටළුවක්ව පවතින බවත් මේ සියළු ප්‍රශ්න විසදීමට නම් සංවර්ධන කටයුතු සිදුවිය යුතු බැවින් සියළු ගොවීන් ඊට විරුද්ධ නොවන බවත් කන්නක් අතහැර හෝ එම සං.කටයුතු සිදුකර දැනට පවතින ගැටළු වලට විසදුම් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත්, යල් කන්න සදහා ජලය අනවශ්‍ය බවත් ඉතා කඩිනමින් එම සංවර්ධන කටයුතු ආරම්භ කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.<br><br>එසේම මේ වන විට විවිධ පිරිස් ස්වපරමාර්ථ පමණක් ඉටු කර ගැනීමේ ආත්මාර්ථකාමී හැගීම් පෙර දැරිව වගා කටයුතු සදහා ජලය ඉල්ලා උද්ඝෝෂණ ආරම්භ කිරීමට බලා සිටින බවත් එසේ වුවහොත් ඊට වඩා විශාල පිරිසක් සමග තමන් ඇතුළු අනෙකුත් ගොවි සංවිධාන වල ගොවීන් ඊට එරෙහිව උද්ඝෝෂණ කිරීමට සූදානම් බවත් , වැව් 05 සදහා ජලය ගෙන යාමේදී විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් වැව් පහ රදුන්න කොටසේ ජනතාවට කන්න 2න් 1ක්වත් සාර්ථකව සිදු කර ගැනීමට නොහැකි බවත් එබැවින් සංවර්ධන කටයුතු වෙනුවෙන් එක් කන්නක් කැප කිරීම එම ගොවි ජනතාවට විශාල පාඩුවක් නොවන බවත් ප්‍රකාශ කරමින් මිණිපේ ප්‍රධාන ඇල සහ බෙදුම් ඇල සංවර්ධන කටයුතු ඉතා කඩිනමින් ආරම්භ කර එම සංවර්ධන කටයුතු සාර්ථක අන්දමින් සිදු කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී. |
| බෝගහවැව<br>ගො.සං. සභාපති | වැව් පහට අදාල ගො.සං. තුළින් සමස්ථයක් ගනු ලැබූ තීන්දු තීරණ වලට ගරු කළ යුතු බවත් තනි තීරණ ක්‍රියාවන්ට නැංවිය නොහැකි බවත් , එබැවින් සංවර්ධන කටයුතු වලට මූලික ස්ථානය ලබා දීමටත් , ජලය අනවශ්‍ය බවත් ප්‍රකාශ කරමින් කියා සිටියේ බෝගහවැව බෙදුම් ඇල සංවර්ධන කටයුතු සදහා වෙන් වී ඇත්තේ අවම මුදලක් බැවින් එම මුදල වැඩි කර ගැටළු පවතින තැන් වලට නිවැරදි පිළියම් යොදමින් එම සංවර්ධන කටයුතු ඉතා කඩිනමින් සිදු කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී. |

| | |
|---|---|
| | |
| ගුරුවෙලයාය ගො.සං. සභාපති | බෝගහවැව සභාපතිතුමාගේ අදහසම ඉදිරිපත් කරමින් කියා සිටියේ ජලය ඉල්ලා උද්ඝෝෂණ කළද මේ වන විට පවතින තත්වයන් හා සැසඳීමේ දී ජලය ලබා දුන්නද කන්න සාර්ථකව සිදු කර ගැනීමට හැකියාවක් නොලැබෙන බැවින් සංවර්ධන කටයුතු සිදු කර ගොවීන්ගේ ගැටළු වලට විසදුම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. |
| | මාරක වැව ගරු සභාපතිතුමා සහභාගී නොවූ අතර සමස්ථ ගොවි ජනතාවගේ හඩ මෙය බවද දන්වන ලදී. |
| | <u>වැව් පහ සදහා ජලය අනවශ්‍ය බවත් කන්න රැස්වීමේ සංශෝදනයක් ලෙස මෙය ඉදිරිපත් කරන බවත් මෙම කාල සීමාව තුළ සංවර්ධන කටයුතු සිදු කර දෙන ලෙස රදුන්න වැව ගො.සං. ලේකම් විසින් යෝජනා කළ අතර 4 පියවර D58/59 ගො.සං. සභාපති විසින් ස්ථිර කරන ලදී.</u> |
| 2 පියවර ප්‍රා. ගො. සභාපති | CRIP ව්‍යාපෘතිය හරහා සංවර්ධනය වන ඇලවල් වල සංවර්ධන කටයුතු සිදු කිරීමටත් එම සංවර්ධන කටයුතු සිදු නොවන ඇලවල් සදහා ජලය ලබා දෙමින් යල කන්න වගා කටයුතු සිදු කිරීම සුදුසු බවට සිටළුම ගො.සං. සභාපතිවරු හා ඒ ඒ රාජ්‍ය ආයතන එක්ව සමස්ථයක් විසින් ගනු ලැබූ තීරණයක් බවත්  එය කිසිවකුගේ ඒකමතික තීරණයක් නොවන බවත් දැනුම් දෙමින් කියා සිටියේ මේ වන විට එම සංවර්ධන කටයුතු සදහා අවස්ථාව ලබා දී මාස 1 ½ ක් පමණ කාලයක් ඉක්මවා ගියද 1, 2, 3,4 පියවර 4 තුළම සැලකිය යුතු මට්ටමෙන් සංවර්ධන කටයුත්තක් සිදු නොවන බවයි. ඊට හේතු විමසමින් ප්‍රකාශ කළේ තවදුරටත් මෙලෙස කිකරුණේ කාලය වැය කළහොත් ඉදියේදී ඉතා ගැටළු රාශියකට මුහුණ දීමට සිදු වන බවත් , සංවර්ධන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් දැනටමත් විවිධ සංවිධාන හරහා ජලය ඉල්ලා අරගල කිරීමට යොමුව ඇති බවත් එබැවින් ඉතා කඩිනමින් වාරිමාර්ග කාර්යාලයේ මැදිහත් වීම මත එම කොන්ත්‍රාත් සමාගම් හා ගොවි ජනතාව අතර දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වා හෝ ගොවි ජනතාව දැනුවත් කරන ලෙසත් ඉතා කඩිනමින් එම සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට කටයුතු යොදන ලෙසත් පවසන ලදී.<br><br>එසේම ප්‍රධාන ඇල රක්ෂිතය දෙපස මේ වන විට කඩ පෙට්ටි ඉදි වෙමින් පවතින බවත් මේ සදහා නීතිය ක්‍රියාත්මක කර හෝ එම ඉදිකිරීම් නතර කර රක්ෂිත ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කළ යුතු බව දන්වා සිටින ලදී. |
| 1 පියවර ප්‍රා. ගො. සං. සභාපති | Crip ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම පිළිබද අදාළ කොන්ත්‍රාත් සමාගම් හා එක්ව ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා කඩිනමින් පැවැත්විය යුතු බවත් ,<br>පොහොර ලබා දීමේදී කෘ.ප.නි.ස. මහතුන්ට මුදල් එකතු කිරීමේ ලබය ලබා නොදෙන ලෙසත් එය ගො.සං. සභාපතිතුමා හරහා සිදු කිරීම තුළින් ගො.සං. නබත්තු මුදල හා සාමාජික මුදල් එකතු තිරීමේ හැකියාව පවතින බැවින් එම අවසථාව ගො.සං. වලට ලබා දීම සුදුසු බවට අදහස් දක්වන ලදී. |
| නේ.ව්‍යා. කළමනාකරු | මිණිපේ වම් ඉවුරු ඇල පුනරුත්තාපන ව්‍යාපෘතිය හරහා ගො.සං. බෙ.ඇලවල් වල සංවර්ධන කටයුතු සදහා නැවතත් රුපියල් මිලියන 40ක් වෙන්ව ඇති බැවින් ව්‍යාපෘති අධ්‍යක්ෂකතුමාට ඒ සම්බන්ධ දැනුවත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. |

<table>
<tr><td></td><td></td></tr>
<tr><td>ව්‍යා. අධ්‍යක්ෂක</td><td>මිණිපේ වම් ඉවුරු ඇල පුනරුත්තාපන ව්‍යාපෘතිය හරහා ගො.සං. බෙ.ඇලවල් වල සංවර්ධන කටයුතු සදහා නැවතත් රුපියල් මිලියන 40ක් වෙන්ව ඇති බවත් එය ගො.සං. සදහා බෙදී ඇති ආකාරය පිළිබද දැනුවත් කරන ලදී. ඒ අනුව ,<br><br><table>
<tr><th>ගො.සං.</th><th>මුදල</th></tr>
<tr><td>බෝගහවැව</td><td>මිලියන 04</td></tr>
<tr><td>ගුරුවෙලයාය</td><td>මිලියන 04</td></tr>
<tr><td>මාරක</td><td>මිලියන 04</td></tr>
<tr><td>මල්ගම්මන</td><td>මිලියන 04</td></tr>
<tr><td>D52</td><td>මිලියන 04</td></tr>
<tr><td>දේවගිරිය</td><td>මිලියන 03</td></tr>
<tr><td>D59</td><td>මිලියන 02</td></tr>
<tr><td>D2</td><td>මිලියන 05</td></tr>
<tr><td>තුල්හිරිය</td><td>මිලියන 04</td></tr>
<tr><td>කරව්ගහවැව 01</td><td>මිලියන 04</td></tr>
<tr><td>FC 08</td><td>මිලියන 02</td></tr>
</table><br>මෙම සංවර්ධන කටයුතු අදාළ ගො.සං. විසින් සිදු කිරීමට අවස්ථාව ඇති බවත් ගො. සං. විසින් එම සංවර්ධන කටයුතු ඉතා සාර්ථක අන්දමින් සිදු කළහොත් ඉදිරි කාලය තුළ ද සංවර්ධන කටයුතු සිදු කිරීමට ගො.සං. වලට අවස්ථාව ලබා දෙන බවත් ඒ සදහා අතිරේක මුදලක් ලබා ගත හැකි බවත් දන්වා සිටින ලදී.</td></tr>
<tr><td>මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතියේ පරිසරවේදී නිලධාරී</td><td>පරිසරය සංරකෂණය සදහා කටයුතු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණක් බවත් ඒ අනුව ඇල පද්ධතිය ආරක්ෂා කිරීම හා ජනතාවගේ යහපත උදෙසා වන වගාවන් සිදු කිරීමට කටයුතු යොදා ඇති බවත් එම වන වගාව සිදු කිරීමේදී ගො.සං. හා සම්බන්ධව ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.</td></tr>
<tr><td>නේ.ව්‍යා.කළමනාකරු</td><td>2018.05.09 දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී crip ව්‍යාපෘතිය සංවර්ධන කටයුතු සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වෙන බැවින් ඒ සදහා පියවර 04 ම ප්‍රා. ගො.සං. සභාපතිවරුන් 04නා ඇතුළුව ගො.සං. නියෝජිතයින් 04ක් සම්බන්ධ වන ලෙස දන්වා සිටින ලදී.</td></tr>
<tr><td>වැල්ඩ්ව් ඇන්ඩ් වෝකර් සමාගම</td><td>2017/18 මාස් කන්නය තුළ මිණිපේ ව්‍යාපාරයේ 2 පියවර හා සම්බන්ධ වෙමින් ගර්කින් වගාව දියත් කළ බැවින් එහිදී වස විසෙන් තොරව අක්කර ¼ ක පමණ ප්‍රමාණයක ගර්කින් වගා කොට 2 පියවර D4 ගො.සංවිධානයේ භාණ්ඩාගාරිකතුමිය විසින් රු.75,000ක මුදලක් ශුද්ධ ලාභය ලෙස උපයාගත් බවත්,<br>යල කන්න සදහා ද වස විසෙන් තොර ගර්කින් වගාව සිදු කොට විශාල ලාභයක් උපයා ගැනීමට අවස්ථාව ලබා දෙන බැවින් ගොවීන් දැන්වත් කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට වැල්ඩ්ව් ඇන්ඩ් වෝකර් සමාගම කටයුතු කරන බව දන්වා සිටින ලදී. විදේශ විනිමය ඉපයීම සදහා ගොවීන්ට අනගි අවස්ථාවක් බවත් මෙම නිශ්පාදන බටහිර රටවල් මිලදී ගැනීමට සූදානම් බවත් දන්වා සිටින ලදී. ගිවිසුම් ගතව 1 kg ක් රු.100 කට වඩා වැඩි මිලකට මිලදී ගැනීමටද , කිසිදු හේතුවක් නිසා රසායනික බෙහෙත් භාවිතා නොකරන ලෙස ද දන්වන ලදී. අවශ්‍ය වුවහොත් ඉතා සරල විෂ අඩු රසායනික ද්‍රව්‍ය නම් කර දෙන බව ද වැඩිදුරටත් දන්වන ලදී</td></tr>
</table>

| | |
|---|---|
| | |
| ව්‍යා. කමිටු ලේකම් ධර්මසේන මහතා | ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී වූ සියලු රාජ්‍ය නිලධාරීන්ටත් සියලුම ගොවි සංවිධාන නිලධාරීන්ටත් ස්තූතිය ප්‍රකාශ කරමින් ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් කටයුතු අවසන් කරන ලදී. |

එම්. ඒ. ති. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය
නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය
මොරගහ, මිනිපේ